# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1656/02 - 2010 මැයි 31 වැනි සඳුදා - 2010.05.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

අංක 915 දරන සුරාබදු නිවේදනය

**සුරාබදු බලපත්‍ර ලත් ආයතන විසින් දේශීය වශයෙන් නිෂ්පාදිත ඖෂධීය නිෂ්පාදන, නිෂ්පාදනය කිරීම සඳහා හෝ අනුමත කර්මාන්ත හා වෙනත් කාර්යයන් සඳහා හෝ යොදා ගනු ලබන ඊතයිල් මධ්‍යසාර මත බදු**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි, (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය යටතේ ජනාධිපති විසින් සාදන ලද නියෝගය යි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2010 මැයි මස 26 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

*නියෝගය*

1. මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ වන භාණ්ඩ මත, එම උපලේඛනයේ II වැනි තීරුවේ නිශ්චිත වශයෙන් දක්වා ඇති ප්‍රමාණයන් මත බද්දක් 2010 ජුනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවනු ලබන්නේ ය.

2. වෙනත් කිසිම නිවේදනයක මීට පටහැනිව කිසිවක් සඳහන් වී තිබුණ ද, ඒ බව නොසලකා මෙම බදු ස්ප්‍රීතු ආනයනය කරන ලද වේලාවේ දී හෝ ස්කාගාරයෙන්, තොග ගබඩාවෙන්, දේශීය නිෂ්පාදනාගාරයෙන් මුදා හරින වේලාවේ දී හෝ ගෙවිය යුතු වන්නේ ය.

3. 2007 දෙසැම්බර් මස 03 වැනි දිනැති අංක 901 සුරාබදු නිවේදනය සහ 2010 පෙබරවාරි මස 17 වැනි දිනැති අංක 1641/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 913 දරන සුරාබදු නිවේදනය සහ 2010 මැයි මස 06 වැනි දිනැති අංක 1652/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 914 දරන සුරාබදු නිවේදන මෙයින් පරිච්ඡින්න කරමි.

*උපලේඛනය*

| | *I වැනි තීරුව*<br>*භාණ්ඩය* | *II වැනි තීරුව*<br>*බදු ප්‍රමාණය* |
|---|---|---|
| 1. | රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන සහ රෝහල්, රජයේ දෙපාර්තමේන්තු හෝ වෙනත් අයුරකින් සුරා බද්දට යටත් වූ පානීය මත්පැන් නිෂ්පාදනය සඳහා බලය ලත් නිෂ්පාදකයින් පාවිච්චි කරනු ලබන (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු | නැත |
| 2. | ස්ප්‍රීතු අඩංගු ඖෂධීය නිෂ්පාදනයන්, නිෂ්පාදනය කිරීම සඳහා ද, කර්මාන්ත කටයුතු සඳහා යොදා ගන්නා සහ නිමි නිෂ්පාදන අපනයනය සඳහා අනුමත ආයතන මගින් යොදනු ලබන (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු සහ වෙනත් කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු සඳහා මාසිකව ලීටර 20,000 සීමාව දක්වා. (නැවත ප්‍රතිශෝධන සඳහා යොදා ගනු ලබන ස්ප්‍රීතු සඳහා ද මෙම කොන්දේසි අදාළ විය යුතුය) නමුත්, මෙහි දැක්වෙන සීමාව හා මෙහි දැක්වෙන කාර්යයන් සඳහා ස්ප්‍රීතු ආනයනය සිදු කරන්නේ නම්, මෙම බද්ද අදාළ නොවේ. | තොග ලීටරයකට රුපියල් එකසිය විසිපහයි (රුපියල් 125/-) |
| 3. | එසේ අනුමත ඉහත අංක 02 හි සඳහන් ආයතනයක් වෙනුවෙන් මාසිකව ලීටර 20,000 ඉක්මවා ලබා ගන්නා ස්ප්‍රීතු සඳහා | තොග ලීටරයකට රුපියල් පන්සියයයි (රුපියල් 500/-) |
| 4. | අශුද්ධ ඊතයිල් මධ්‍යසාර ස්ප්‍රීතු (කාර්මික ස්ප්‍රීතු/දුර්වල ස්ප්‍රීතු) සඳහා | තොග ලීටරයකට රුපියල් සියයයි (රුපියල් 100/-) |

06 - 323

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.